DOI: 10.31357/fhssmph.2015.00080

# ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටය : දෘශ්‍යාත්මක මානව විද්‍යා අධ්‍යයනයක්

(රජයේ චිත්‍රපට අංශයේ නිර්ප්‍රබන්ධ චිත්‍රපට කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්)

මිල්ලවිටිය ගම්ලත්ගේ සුමින්ද කිත්සිරි ගුණරත්න

22 JUN 2015

දර්ශනපති 2014

# ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටය :
# දෘශ්‍යාත්මක මානව විද්‍යා අධ්‍යයනයක්

(රජයේ චිත්‍රපට අංශයේ නිර්ප්‍රබන්ධ චිත්‍රපට කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්)

මිල්ලවිටිය ගම්ලත්ගේ සුමින්ද කිත්සිරි ගුණරත්න

ලියාපදිංචි අංකය : 1803552011002

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා දර්ශනපති (සපර්යේෂණ)

උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2014 මැයි 23

## කර්තෘත්ව සහතිකය

දර්ශනපති උපාධිය සඳහා මා විසින් සම්පාදනය කරන ලද ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටය : දෘශ්‍යාත්මක මානව විද්‍යා අධ්‍යයනයක් (රජයේ චිත්‍රපට අංශයේ නිර්ප්‍රබන්ධ චිත්‍රපට කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්) නම් වූ පර්යේෂණ නිබන්ධයේ ඇතුළත් කිසිවක් වෙනත් විශ්වවිද්‍යාලයක හෝ එවැනි ආයතනයක කිසිදු උපාධි හෝ වෙනත් පශ්චාද් උපාධි අවශ්‍යතාවයක් සඳහා මෙලෙස ම හෝ කොටස් වශයෙන් හෝ ඉදිරිපත් කර නොමැති බවත් මෙය මා විසින් ම රචනා කරන ලද්දක් බවත් මෙහි ඇතුළත් වෙනත් පර්යේෂණ හෝ පොත්පත් වලින් ගනු ලැබූ දත්ත හෝ තොරතුරු කිසිවක් නිවැරදි උපුටාගැනීමකින් හෝ සඳහන් කිරීමකින් තොරව භාවිත කර නොමැති බවත් පරීක්ෂක මණ්ඩලය විසින් වාචික පරීක්ෂණයේ දී ලබා දුන් සියළු සංශෝධන සහිත ව ඉදිරිපත් කරන බවත් සහතික කරමි.

.............................................

2015 ජුනි 16

එම්. ජී. එස්. කේ. ගුණරත්න

## උපදේශකවරුන්ගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය දර්ශනපති උපාධිය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත්, වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සියළු සංශෝධන සහිතව නිබන්ධය සකසා ඇති බවටත් සහතික වෙමු.

2015/06/17

දිනය

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

2015.06.22

දිනය

ආචාර්ය ජයන්ත ජයසිරි

# පටුන

පිටු අංක


**පළමු පරිච්ඡේදය**

**අධ්‍යයනයේ පසුබිම හා වැදගත්කම**

1.1 හැඳින්වීම 1-15

1.2 අධ්‍යයන ගැටලුව 15

1.3 අධ්‍යයනයේ දී මතු වූ දුෂ්කරතා හා සීමා 15-17

1.4 පර්යේෂණ අරමුණු 17

1.5 පර්යේෂණ ක්‍රමවේදය 17-20

**දෙවන පරිච්ඡේදය**

**මානවවංශලේඛනය : සංකල්පීය විග්‍රහයක්**

2.1 මානවවංශලේඛනය : නිර්වචන ආශ්‍රිත ව විමසීම 21-27

2.2 මානවවංශලේඛ සිනමාව සහ සිනමාත්මක මානවවංශලේඛනය 27-31

**තෙවන පරිච්ඡේදය**

**දෘශ්‍යාත්මක මානවවිද්‍යාව හා මානවවංශලේඛ චිත්‍රපටය**

3.1 දෘශ්‍යාත්මක මානවවිද්‍යාව 32-34

3.2 දෘශ්‍යාත්මක මානවවිද්‍යාවේ විකාශය 35-36

3.3 ජගත් දෘශ්‍යාත්මක මානවවිද්‍යා චිත්‍රපට 37

3.3.1 ජගත් දෘශ්‍යාත්මක මානවවිද්‍යා චිත්‍රපට නාමාවලිය 37-44

3.4 චිත්‍රපට ප්‍රකාර (Film Genres) සහ මානවවංශලේඛ චිත්‍රපට (Ethnographic Films) 45-49

3.5 මානවවංශලේඛ චිත්‍රපටයේ ප්‍රයෝජන 50-52

3.6 මානවවංශලේඛ චිත්‍රපටයේ ජගත් පසුබිම 52-54

3.7 මානවවංශලේඛ චිත්‍රපටය හඳුනා ගැනීම 55-58

සිව්වන පරිච්ඡේදය

ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටයේ ආරම්භක පසුබිම


4.1 යටත් විජිත යුගය හා ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතිය 59-67

4.2 මානවවංශලේඛ චිත්‍රපටය සහ ''ලංකා ගීතය'' 67

4.2.1 ''ලංකා ගීතය'' චිත්‍රපටයේ තාක්ෂණික දත්ත 68-70

4.2.2 ලංකා ගීතයේ සංස්කරණ රීතිය 70-76

4.2.3 ''හයිඩර් ආකෘතිය'' ඔස්සේ ලංකා ගීතය විමර්ශනය 76-86

4.3 යටත්විජිත යුගයේ නිෂ්පාදිත ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට ආරම්භක පසුබිමට අදාළ විදේශීය චිත්‍රපට නාමාවලිය 86-87


පස්වන පරිච්ඡේදය

ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටය


5.1 රජයේ චිත්‍රපට අංශය ඇරඹීම කෙරේ බලපෑ පශ්චාද් යටත්විජිත ප්‍රවණතා 88-94

5.2 රජයේ චිත්‍රපට අංශයේ මානවවංශලේඛ චිත්‍රපට පිළිබඳ විමර්ශනය 94-95

5.2.1 ප්‍රවෘත්ති චිත්‍රපට (News Reels) 95-96

5.2.1.1 ප්‍රවෘත්ති චිත්‍රපට නාමාවලිය 97-102

5.2.1.2 තෝරාගත් ප්‍රවෘත්ති චිත්‍රපට පිළිබඳ මානවවංශලේඛ විශ්ලේෂණය 102-106

5.2.2 සංවර්ධන ව්‍යාපාර පිළිබඳ චිත්‍රපට 106-107

5.2.2.1 සංවර්ධන ව්‍යාපාර පිළිබඳ චිත්‍රපට නාමාවලිය 107-114

5.2.2.2 සංවර්ධන ව්‍යාපාර පිළිබඳ තෝරාගත් චිත්‍රපට විශ්ලේෂණය 115-117

5.2.3 ජන සංස්කෘතිකාංග, කලා ශිල්ප සහ ආගමික අවස්ථා අළලා නිපද වූ චිත්‍රපට 118

5.2.3.1 ජන සංස්කෘතිකාංග, කලා ශිල්ප සහ ආගමික අවස්ථා අළලා නිපද වූ චිත්‍රපට නාමාවලිය 119-125

5.2.3.2 තෝරාගත් ජන සංස්කෘතිකාංග, කලා ශිල්ප සහ ආගමික අවස්ථා අළලා නිපද වූ චිත්‍රපට විශ්ලේෂණය 125-127

5.2.4 විශිෂ්ට පුද්ගල චරිත අළලා නිපද වූ චිත්‍රපට 127-128

5.2.4.1 විශිෂ්ට පුද්ගල චරිත අළලා නිපද වූ චිත්‍රපට නාමාවලිය 128-132

5.2.4.2 විශිෂ්ට පුද්ගල චරිත අළලා නිපදවූ චිත්‍රපට විශ්ලේෂණය 133-135

5.2.5 විවිධ උප සංස්කෘතික සමාජ අළලා නිර්මාණය වූ චිත්‍රපට 135

5.2.5.1 විවිධ උප සංස්කෘතික සමාජ අළලා නිර්මාණය වූ
චිත්‍රපට නාමාවලිය 135-138
5.2.5.2 විවිධ උප සංස්කෘතික සමාජ අළලා නිපදවූ චිත්‍රපට
විශ්ලේෂණය 138-149
5.2.6 පුරාවිද්‍යාත්මක උරුම ගවේෂිත චිත්‍රපට 149
5.2.6.1 පුරාවිද්‍යාත්මක උරුම ගවේෂිත චිත්‍රපට නාමලේඛනය 150-152
5.2.6.2 තෝරාගත් පුරාවිද්‍යාත්මක උරුම ගවේෂිත චිත්‍රපට
විශ්ලේෂණය 152-155
5.2.7 සමාජ, දේශපාලන, ආර්ථික පරිවර්තන අළලා නිපද වූ චිත්‍රපට 156
5.2.7.1 සමාජ, දේශපාලන, ආර්ථික පරිවර්තන අළලා නිපද වූ
චිත්‍රපට නාමාවලිය 156-161
5.2.7.2 සමාජ දේශපාලන පරිවර්තන අළලා නිපද වූ තෝරාගත්
චිත්‍රපට විශ්ලේෂණය 161-163

**සවැනි පරිච්ඡේදය**

**ශ්‍රී ලාංකේය චිත්‍රපට සංරක්ෂණයේ පසුබිම සහ රජයේ චිත්‍රපට අංශයෙන් බැහැරව නිෂ්පාදිත නිර්ප්‍රබන්ධ චිත්‍රපට**

**6.1** සිනමා සංරක්ෂණය : මානවවංශලේඛන මාධ්‍යයක් ලෙස 164-166
**6.2** ජගත් චිත්‍රපට සංරක්ෂණයේ ඇරඹුම 166-167
**6.3** ශ්‍රී ලාංකේය චිත්‍රපට සංරක්ෂණ පසුබිම 168-171
6.3.1 විදේශීය චිත්‍රපට සංරක්ෂණාගාර 172-173
6.3.2 රජයේ සංරක්ෂණාගාර 173
6.3.2.1 රජයේ චිත්‍රපට අංශය සතු සංරක්ෂණාගාරය 173-176
6.3.2.2 රජයේ චිත්‍රපට සංස්ථාව සහ චිත්‍රපට සංරක්ෂණය 176-180
6.3.3 ශ්‍රී ලංකාවේ පෞද්ගලික චිත්‍රපට සංරක්ෂකයෝ 180-183
**6.4** රජයේ චිත්‍රපට අංශයෙන් බැහැරව නිපද වූ නිර්ප්‍රබන්ධ චිත්‍රපට
(1949 ට පෙර යුගය) 184-189
6.4.1 රජයේ චිත්‍රපට අංශයෙන් බැහැර ව නිපදවන ලද නිර්ප්‍රබන්ධ
(Non-fiction) සිංහල චිත්‍රපට නාමාවලිය 189-196

**සත්වෙනි පරිච්ඡේදය**

**සිංහල ප්‍රබන්ධ චිත්‍රපටය : මානවවංශලේඛ අර්ඝ කිරීමක්**

7.1 සිංහල ප්‍රබන්ධ චිත්‍රපටයේ ආරම්භය හා විකාශනය :
'කඩවුණු පොරොන්දුවට පෙර සිනමාව' 197-202

7.1.2 සිලෝන් තියටර් සමාගම බිහිවීම සහ ශ්‍රී ලාංකේය සිංහල
ප්‍රබන්ධ සිනමාව සඳහා ප්‍රේක්ෂක පසුබිමක් සැකසීම 202-204

7.2 සිංහල ප්‍රබන්ධ චිත්‍රපටය කෙරේ බලපෑ ඉන්දියානු සිනමාව :
ප්‍රභවය, වර්ධනය හා සිනමා ප්‍රවණතා ආශ්‍රිත විමසීමක් 205-208

7.3 සිංහල ප්‍රබන්ධ චිත්‍රපටයේ ආරම්භය
''කඩවුණු පොරොන්දුවෙන් පසු'' සිනමාව 208-212

7.4 ප්‍රථම සිංහල කථානාද ප්‍රබන්ධ චිත්‍රපටයට නිර්මාණ දායකත්වය සැපයූ
මීගමුව මිනර්වා නාට්‍ය කණ්ඩායම 212-217

**අටවෙනි පරිච්ඡේදය**

**සමාලෝචනය** 218-235

පරිශීලිත මූලාශ්‍රයෝ 236-240

උපග්‍රන්ථ

I. අධ්‍යයනයේ දී විමර්ශනයට පාත්‍ර නොවූ රජයේ චිත්‍රපට අංශයේ චිත්‍රපට නාමාවලිය

II. සිංහල ප්‍රබන්ධ සිනමාවේ සමාරම්භය පිළිබඳ විරල දත්ත සම්පාදනයක් සිදු වූ ආතර් යූ. අමරසේනගේ සිළුමිණ පුවත්පතේ 'රූ රැසේ අඳිනා ලෙසේ' කලා අතිරේකයේ පළ වූ ලිපිය

III ඡායාරූපාවලිය

# උපකාරානුස්මෘති


- අධ්‍යයනාරම්භයේ සිට ම සදුපදේශ සපයමින් ධෛර්යය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර, ආචාර්ය ජයන්ත ජයසිරි උපදේශකතුමන්ලාට ගෞරවය හා ස්තුතිය පළ කරමි.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සියලු ම දෙනා ලබා දුන් සහයෝගය අගයමි.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක මහතා කරන ලද මඟපෙන්වීම් ස්තුතිපූර්වක ව සිහිපත් කළ යුතුය.
- රජයේ චිත්‍රපට අංශයේ වාර්තා චිත්‍රපට නැරඹීම සඳහා විරල ගණයේ අවස්ථාවක් මා වෙත උදා වූයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා, ආසියානු සිනමා කේන්ද්‍රයේ අධ්‍යක්‍ෂ ඇෂ්ලි රත්නවිභූෂණ මහතා සහ රංජනී රත්නවිභූෂණ මහත්මිය නිසා ය. ඔවුන්ට ද තුති පුදමි.
- සබරගමු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතා නොවන්නට මා කිසි විටෙක මෙබඳු පර්යේෂණ කටයුත්තක් සඳහා යොමු නොවනු ඇත. දෛනික ජීවිතය සහ රැකියා කටයුතු හේතුවෙන් ශාස්ත්‍රාලයීය කටයුතු කෙරෙහි වරින්වර උකටලී වූ මාගේ චිත්ත ධෛර්යය නංවාලීමට සෑම අතින් ම ඔහු ලබා දුන් දයා උපදේශයන් මිතුරු ගෞරවයෙන් සඳහන් කරමි.
- රජයේ චිත්‍රපට අංශයේ රසායනාගාරය භාර නිලධාරී ලාල් විජේතුංග මහතා ඇතුළු කාර්යමණ්ඩලය දැක්වූ අනුග්‍රහය ද සිහිපත් කළ මනා ය.
- දෘශ්‍යාත්මක මානවවිද්‍යාව හා මානවවංශලේඛ චිත්‍රපටය පිළිබඳ ජගත් සම්පූජිත කෘති අන්තර්ජාලය ඔස්සේ ඇනවුම් කොට ගෙන්වා ගැනීම සඳහා මඟපෙන්වූ සියලු දෙනාට තුති පුදමි.
- අධ්‍යයනයේ දත්ත සම්පාදකයින් ලෙසින් සම්මුඛ සාකච්ඡා, අදහස් දැක්වීම් සිදු කළ සියලු දෙනාට කෘතඥ වෙමි. පෞද්ගලික චිත්‍රපට සංරක්‍ෂණාගාර හිමියෝ ද මේ අතර වෙති.
- පර්යේෂණ නිබන්ධය එහි නිමාව දක්වා ම ඉතා නිවැරදි ව පරිගණකගත කළ ජයලිය ජයසේකර නැගණියට ද තුති පුදමි.
- මෙබඳු අධ්‍යයන කාර්යයක් සඳහා ප්‍රවිවේකය මා හට සපයා දෙමින් කුටුම්භගත ජීවිතයේ පිරිපත ඉසිලූ මාගේ බිරිඳ සහ ඇයගේ පවුලේ මව්පියන්, මාගේ පුතණුවන් සහ දියණිය දයාවෙන් සිහිපත් කරමි.
- කුඩා කල සිට ම කිසියම් වැදගත් ''සමාජ කාර්යයක්'' සිදු කළ යුතු ය යන විශ්වාසය තහවුරු කළ මගේ පියාණන්, මෑණියන්, සහෝදරයා සහ සහෝදරිය ඇතුළු සියලු දෙනාගේ ශක්තිය අවිඥානික ව මා වෙත ලැබුණු බව නිසැක ය.

# ශ්‍රී ලාංකේය මානවවංශලේඛ චිත්‍රපටය : දෘශ්‍යාත්මක මානව විද්‍යා අධ්‍යයනයක්

**(රජයේ චිත්‍රපට අංශයේ නිර්ප්‍රබන්ධ චිත්‍රපට කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්)**

එම්. ජී. එස්. කේ. ගුණරත්න

## සාරාංශය

ශ්‍රී ලාංකේය සිනමාවේ ඇරඹුම් අවස්ථා උපදින විසිවන සියවසේ මුල් දශක තුන ගතවන විට ජගත් මානවවංශලේඛ චිත්‍රපට ප්‍රකාරයේ පුරෝගාමී චිත්‍රපට කිහිපයක් ම බිහි වී අවසන් ය. අනතුරු ව එළැඹි දශකයන්හි පෘතුගාලය, පෝලන්තය, ප්‍රංශය බඳු රටවල චිත්‍රපට අධ්‍යක්‍ෂවරුන් සහ මානවවිද්‍යාඥයන් අතින් මෙම චිත්‍රපට ප්‍රකාරය පෝෂණය විය. මානව විද්‍යාඥයන් දුක් වූ දෘශ්‍යාත්මක මානවවිද්‍යාව හා මානවවංශලේඛනය පිළිබඳ අදහස් මානවවංශලේඛ චිත්‍රපට ප්‍රකාරය වර්ධනය වීම කෙරෙහි බලපෑවේ ය. අප්‍රිකානු, ඕස්ට්‍රේලියානු මහද්වීපික, කැරිබියන් දූපත් ආශ්‍රිත ජනගෝත්‍ර, ඇස්කිමෝවරුන් ඈ විවිධ සංස්කෘතීන් පිළිබඳ සජීවී සිනමා දර්ශන හරස් සංස්කෘතික අධ්‍යයනය සඳහා පාදක කරගත හැකි ය. එහෙත් මෙතෙක් හඳුනා නොගත් ශ්‍රී ලාංකේය මානවවංශලේඛ අගනාකම් සහිත චිත්‍රපට, ලොව මානවවංශලේඛ චිත්‍රපට අතරට යා යුතු ශ්‍රී ලාංකේය චිත්‍රපට ප්‍රකාරයක් හඳුනා ගැනීමට කටයුතු කර ඇත. ඒ සඳහා ශ්‍රී ලාංකේය නිර්ප්‍රබන්ධ චිත්‍රපටය පිළිබඳ විශේෂ අවධානය ද රජයේ චිත්‍රපට අංශයේ චිත්‍රපට පිළිබඳව සුවිශේෂී අවධානය ද යොමු විය.

රේඛාව චිත්‍රපටය (1956) සමග සිනමා කැමරාව චිත්‍රාගාරයෙන් එළියට පැමිණ ශ්‍රී ලාංකේය ජන ජීවිතය දෙසට එල්ල වූ බව සිනමා විචාරයේ ප්‍රකට අදහසකි. එහෙත් දෘශ්‍යාත්මක මානව විද්‍යා දැක්මක් ඔස්සේ ශ්‍රී ලාංකේය චිත්‍රපටයේ ඇරඹුම සොයා යැමේ දී ''රේඛාවට'' එහා කිමිදීමට සිදු විය. මෙරට යටත්විජිතයක් පැවතීම නිසා දුම්රිය, මෝටර් රථය මෙන් ම සිනමාව වැනි මානව තාක්‍ෂණික ජයග්‍රහණ වහා ම

මෙරටට හඳුන්වා දීමට අධිරාජ්‍යවාදී පාලකයෝ ක්‍රියා කළහ. ඒ අනුව ප්‍රාග් සිනමා අද්දැකීම් මෙරට ජනතාවට විඳ ගැනීමට සැලසුණු බව තහවුරු විය. colonial film වෙබ් අඩවියට අනුව යටත්විජිත යුගය තුළ මෙරට ජන ජීවිතය සහ බ්‍රිතාන්‍ය පාලනයේ විවිධ අවස්ථා අළලා චිත්‍රපට නිපදවා තිබේ. 1949 දී රජයේ චිත්‍රපට අංශය බිහිවීමෙන් පසු ව නිසි පරිදි මෙරට මානවවංශලේඛ චිත්‍රපට ප්‍රකාරය ඇරඹූ බව අධ්‍යයනයේ දී තහවුරු විය. ඒ සඳහා පුරෝගාමී වූ අධ්‍යක්ෂවරු අතර ඉතාලි ජාතික ජුලියෝ පෙට්‍රෝනි, බ්‍රිතාන්‍ය ජාතික රැල්ෆ් කීන් ද වූහ. පසු ව අර්වින් වීරක්කොඩි, ලෙස්ටර් ජේම්ස් පීරිස් වැනි ශ්‍රී ලාංකේය චිත්‍රපට අධ්‍යක්ෂවරු එම කාර්යය මනා ව සිදු කළහ. මානවවංශලේඛ චිත්‍රපට ලෙස හඳුනා ගත් චිත්‍රපට අතරින් මානවවංශලේඛ පරාමිතීන්ට සාකල්‍යයෙන් ම ගැළපී සිටින චිත්‍රපට කිහිපයකි. අර්වින් වීරක්කොඩිගේ Living Wild (1959), සුදත් මහදිවුල්වැවගේ සත්වෙනි සැඳෑවේ ගීතය (1995) ඒ අතරින් කැපී පෙනේ. ප්‍රමුඛ අධ්‍යයනයක් ලෙස රජයේ චිත්‍රපට අංශය කෙරෙහි පමණක් සීමා වුව ද පෞද්ගලික සංරක්ෂණාගාර හා සංරක්ෂකයන් සතු වාර්තා චිත්‍රපට මෙන්ම ශ්‍රී ලාංකේය ප්‍රබන්ධ චිත්‍රපටය කෙරෙහි ද අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරිණ.

# පළමු පරිච්ඡේදය

# අධ්‍යයනයේ පසුබිම හා වැදගත්කම

## 1.1 හැඳින්වීම

නූතන ශ්‍රී ලාංකේය මානවවිද්‍යා සම්ප්‍රදායක් බිහි කර ගැනීමට පර්යේෂණ දැනුම සමාජගත කිරීමේ දී නවීන තාක්‍ෂණික පහසුකම් භාවිතය අත්‍යවශ්‍ය සාධකයකි. ඒ නිසා ම පර්යේෂණ දැනුම සමාජගත කිරීම සඳහා නව විධික්‍රම කරා එළඹීම කාලීන අවශ්‍යතාවකි. ඒ සඳහා මෙතෙක් මෙරට භාවිත වූ ජනප්‍රිය විධික්‍රමයක් වූයේ නවකතාවක ආකාරයෙන් (ප්‍රබන්ධ කතා ආකෘතිය මගින්) මානවවිද්‍යා දැනුම, ඉදිරිපත් කිරීම යි. එහෙත් මානව විද්‍යා දැනුම සාහිත්‍ය ප්‍රකාරයෙන් ඉදිරිපත් කිරීමට වඩා වැඩි ආකර්ෂණීය හා යථාරූපී භාවයක් (realistic) සිනමාත්මක ඉදිරිපත් කිරීමක් මගින් සිදුවන බැව් නූතන මානවවිද්‍යා ක්‍ෂේත්‍රයේ පිළිගැනීම යි. ඒ සඳහා අවශ්‍ය ශික්ෂණ ක්‍රමය සම්පාදනය සඳහා දෘශ්‍යාත්මක මානවවිද්‍යාව (visual anthropology) යනුවෙන් නව විෂය ධාරාවක් ජගත් පරිමාණයෙන් වර්ධනය වී ඇත. ඒ අනුව දෘශ්‍යාත්මක ඉදිරිපත් කිරීම් හා අන්වේක්‍ෂණයන්ගෙන් තොර ව මානවවංශ ලේඛනකරණය (ethnography) නිසි පරිදි කළ නොහැකිය යන මතය වඩ වඩාත් තහවුරු වෙමින් පවතී. 'New Terrain ; No Visual, No Anthropology' යනුවෙන් ෆැඩ්වා එල්. ගුන්දි (Fadwa L. Guindi) පවසන්නේ එබැවිනි (Guindi 2004 : 10). මානවවංශ ලේඛනකරණයේ දී දෘශ්‍යාත්මක මාධ්‍යයක් ලෙස සිනමාව සතු අසම හැකියාව මාග්‍රට් මීඩ් (Margaret Mead), පෝල් හෝකින් (Paul Hockings), ජීන් රොච් (Gean Rouch) ද අවධාරණය කරති (Emilie 1975 : 3-38). සිනමාව මානවවිද්‍යානුකූල යථාර්ථාන්වේක්‍ෂණයේ සංකථනයක් ලෙස (Film as Discourse; The Invention of Anthropological Realities) භාවිත කළ හැකි බව පීටර් ඉයන් ක්‍රවුෆොඩ් (Peter Ian Crawford) පෙන්වා දෙයි (Crawford, 1992 :

66-79). ඒ හෙයින් ශ්‍රී ලාංකේය මානවවිද්‍යා ක්ෂේත්‍රයේ දෘශ්‍යාත්මක මානවවිද්‍යා සංකල්ප ස්ථාපිත කිරීම සහ මානවවංශලේඛ චිත්‍රපට සම්ප්‍රදායක් තහවුරු කිරීම කාලෝචිත හා අත්‍යවශ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රයකි.

ශ්‍රී ලාංකේය මානවවිද්‍යා ක්ෂේත්‍රයේ දෘශ්‍යාත්මක මානවවිද්‍යා සංකල්ප තහවුරු කිරීම; ලාංකේය මානවවංශලේඛ චිත්‍රපට (ethnographic film) සම්ප්‍රදායක් පිළිබඳ අවධානය යොමු කරවන්නකි. එය මානවවිද්‍යා දැනුම් ගවේෂණයේ හා ප්‍රකාශනයේ නව විධික්‍රම පෙන්වා දීමක් මෙන් ම ග්‍රන්ථානුසාරී දැනුම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ සීමා හා ගැටලු අතික්‍රමණයට හේතු වන්නකි. වාර්තාමය ස්වරූපයෙන් බිහි වූ ජගත් මානවවංශලේඛ චිත්‍රපටය සමාරම්භක අවස්ථාවේ සිට ම වැදගත් මානවවිද්‍යාත්මක කාර්යභාරයක් සපුරා ඇත. ''සෑම චිත්‍රපටයක් ම මානවවංශලේඛනයකි'' (Every film as Ethnographic) යන ප්‍රවාදය ගොඩනැඟෙන්නේ ද මෙම ඓතිහාසික සන්දර්භයෙනි (ibid : 01-02). 1990 දී රාජකීය මානවවිද්‍යා ආයතනයේ දෙවන ජාත්‍යන්තර මානවවංශ චිත්‍රපට උළෙලට සමගාමී ව පැවති විද්වත් සම්මන්ත්‍රණයේ තේමාව ''චිත්‍රපටය මානවවංශලේඛනයක් ලෙස'' (Film as Ethnographic) යන්න යි. එහෙත් ජගත් දෘශ්‍යාත්මක මානවවිද්‍යා ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලාංකේය සිනමා කෘති විමර්ශිත අවස්ථා හමුවන්නේ ඉතා විරල ව ය. ජගත් මානවවංශලේඛ චිත්‍රපට නාමාවලීන්හි ශ්‍රී ලාංකේය චිත්‍රපට අන්තර්ගත නොවීමෙන් ම එය පැහැදිලි වේ (Visual anthropology films VAF 2012). ඒ අනුව ශ්‍රී ලාංකේය චිත්‍රපට පිළිබඳ මානවවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් සංකථනයක් සම්පාදනය කිරීමත් මානවවංශලේඛ පරාමිතීන්ට අනුකූල චිත්‍රපට ප්‍රකාරයක් හඳුනා ගැනීමත් අපේක්ෂා කෙරුණි. මෙම පර්යේෂණය සිනමා හා මානවවිද්‍යා ක්ෂේත්‍ර දෙකෙහි ම අගනාකම් මතුකර දී ඇති අතර, එය මෙරට මානවවංශලේඛ චිත්‍රපට ප්‍රකාරයක් හඳුනා ගැනීමට උපස්ථම්භක විය.

ශ්‍රී ලාංකේය සිනමාවේ ඇරඹුම් අවස්ථා උපදින විසිවන සියවසේ මුල් දශක තුන ගතවන විට ජගත් මානවවංශලේඛ චිත්‍රපට ප්‍රකාරයේ (gener) පුරෝගාමී චිත්‍රපට කීපයක් ම බිහි වී අවසන් ය. රොබට් ජේ. ප්ලෙහාර්ටිගේ (Robert J. Flaherty) 'නැනුක් ඔෆ් ද නෝර්ත්' (Nunook of the North, 1922), මෝනා (Mona, 1926), මෑන් ඔෆ් ඇරන් (Man of Aran, 1934) චිත්‍රපට ඒ අතර වේ. අනතුරු ව එළැඹි දශකයන්හි දී පෘතුගාලය, පෝලන්තය, ප්‍රංශය බඳු රටවල චිත්‍රපටකරුවන් අතින් මෙම චිත්‍රපට ධාරාව පෝෂණය විය. කාර්මීකරණය (industrialization), වාණිජකරණය (commercialization), සංස්කෘතික කම්පනය (cultural shock) වැනි සමාජ මානවවිද්‍යාත්මක සංකල්ප මගින් හඳුනාගත හැකි සමාජ විපර්යාසයන් රැසක් යටත්විජිත රාජ්‍යයන්හි සිදුවෙමින් පැවතිණ. තම විජිත සංස්කෘතීන් නවීකරණයට (modernization) හසුවීමෙන් ශීඝ්‍රයෙන් වෙනස් වන බැව් අධිරාජ්‍යවාදී පාලකයෝ දුටහ. එමෙන් ම අධිරාජ්‍යවාදී පාලනයේ ශාස්ත්‍රාලයීය අධිකාරිය (academic authority) විසින් ද මෙම සංස්කෘතීන් සංරක්ෂණය කිරීමේ සහ ලේඛනයේ වැදගත්කම ඉස්මතු කළේ ය. විශේෂයෙන් ම ඇමරිකාවේ ෆ්‍රාන්ස් බොආස් (France Boas), බ්‍රිතාන්‍යයේ ඊ. බී. ටයිලර් (E. B. Tylor) වැනි මානව විද්‍යාඥයන් දැක්වූ සංස්කෘතික මානවවිද්‍යාව පිළිබඳ අදහස් ඊට බලපෑවේ ය.

මෙම පසුබිම ආශ්‍රිත ව අගනා මානවවංශලේඛ චිත්‍රපට නිපදවීමට චිත්‍රපට අධ්‍යක්ෂවරු පෙළඹුණාහ. ඒ අනුව ඇතැම් අප්‍රිකානු, ඕස්ට්‍රේලියානු මහද්වීපික හා කැරිබියන් දූපත් ආශ්‍රිත ජනගෝත්‍ර පිළිබඳ ව සජීවී සිනමා දර්ශන අදටත් අපට දැකගන්නට අවස්ථාව සැලසී ඇත. එහෙත් මේ වකවානුවේ දී ලංකාවේ මානවවිද්‍යා ක්ෂේත්‍රයේ බහුල ව සිදුවූයේ සාහිත්‍යමය ප්‍රකාරයේ පර්යේෂණ පමණි. සෙලිග්මන් යුවළ විසින් රචිත 'The Vaddas' (1911) කෘතිය ද, ආර්. ඇල්. ස්පිට්ල්, ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත මානව විද්‍යාත්මක නවකතා ද මේ අතර වේ. බොහෝ විට ඔවුන්ගේ අවධානයට ලක් වූයේ වැදි ජනතාව සහ දුෂ්කර වන්නියේ සිංහල ගැමි ජනතාව පිළිබඳ ව ය. එහෙත් ඡායාරූපයක් ගැනීම විනා මොවුන් පිළිබඳ ව සිනමාත්මක වාර්තාකරණයක්

නොවීම අවාසනාවකි. ඔවුන් අතින් The Living Wild (1959) වැනි චිත්‍රපටයක් නිර්මාණය වී තිබුණේ නම් මෙරට වැදි ජනතාව පිළිබඳ ව ජාත්‍යන්තර මානවවිද්‍යාඥයන්ගේ අවධානය මීට වඩා ප්‍රබල ව යොමුවීමට හේතු විය හැකි ව තිබුණි. එමෙන් ම එය ජගත් මානවවංශලේඛ චිත්‍රපට නාමාවලීන්හි මුල් පෙළේ චිත්‍රපටයක් ද වනු නිරනුමාන ය. එබැවින් මෙම පර්යේෂණයේ දී ජගත් මානවවංශලේඛ චිත්‍රපට අතරට යා යුතු ශ්‍රී ලාංකේය චිත්‍රපටය පිළිබඳ සංකථනයක් සම්පාදනය කර ඇත.

සිනමාව මානවවංශලේඛ මාධ්‍යයක් ලෙස මානව විද්‍යාඥයන්ගේ විමර්ශනයට පාත්‍ර ව තිබීම අපගේ මේ වෑයම තවත් දිරිගන්වන්නක් විය. මාග්‍රට් මීඩ්, ජීන් රොච්, කාර්ල් ජී. හයිඩර් (Karl G. Heider), පෝල් හොකින්ස්, පිලිප් ඩී. කොටැක් (Phillip D. Kotack) වැනි මානවවිද්‍යාඥයෝ ද මේ අතර වෙති. හැට හා හැත්තෑව ද්විදශකයන්හි දී දෘශ්‍යාත්මක මානවවිද්‍යාවේ අභිවෘද්ධියට ප්‍රබල මැදිහත්වීමක් සිදු කළ මාග්‍රට් මීඩ් පවසන පරිදි තාරකා විද්‍යාවේ දියුණුවට දුරේක්ෂය ද රසායන විද්‍යාවේ දියුණුවට අන්වීක්ෂය ද ප්‍රබල ලෙස දායක විය. මානවවිද්‍යා පර්යේෂණ සඳහා සිනමා භාවිතය වියදම අධික කටයුත්තක් බැව් ඇතැම් මතයකි. මුල් අවස්ථාවේ දී දුරේක්ෂය හා අන්වීක්ෂය ද පිරිවැය අධික භාවිතයක් ම විය. එහෙත් පිරිවැයට වඩා පර්යේෂණය වැදගත් බැවින් විද්‍යාඥයෝ එම උපකරණ යොදා ගත්හ. ඒ අනුව තාරකා විද්‍යාව මෙන් ම රසායන විද්‍යාව ද දියුණු වූ අතර නව සොයාගැනීම් මානව සංහතියට ම බලපෑවේ ය. එබැවින් 'සිනමාව' නමැති විශිෂ්ට තාක්ෂණික උපකරණය ද මානව විද්‍යාවේ දියුණුවට අදාළ වේ. සිනමාව මානවවිද්‍යා පර්යේෂණයන්ට දායක කර නොගැනීම සාපරාධී ප්‍රතික්ෂේපයක් (a criminal neglect) ලෙස මාග්‍රට් මීඩ් ප්‍රකාශ කළා ය (Mead 1975 : 07). ඇය සිනමාව කෙරේ මෙම ප්‍රකාශය සිදු කරන්නේ හැත්තෑව දශකයේ දී ය. එහෙත් වර්තමානයේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, අංකිත තාක්ෂණය (digital technology) ඔස්සේ ශීඝ්‍ර දියුණුවක් ලබා තිබේ. ඒ අනුව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සිනමාවට සාපේක්ෂ ව